www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඔබාමා ඉරානයට තර්ජනය කරයි

## Obama threatens Iran

2010 අගෝස්තු 06

බදාදා දින ධවල මන්දිරයේ පැවති පුවත්පත් සාකච්ඡාවේදී ඉරානයට එරෙහිව වොෂිංටනයෙන් සහ එහි මිතුරන්ගෙන් එල්ලවෙන යුද තර්ජනයේ නැගෙන සමූහ ගායනයට ජනාධිපති ඔබාමා පෞද්ගලිකවම හවුල් විය.

2008 වසරේදී "මැදපෙරදිග තවත් යුද්ධයකට" එරෙහිව තර්ක කල එක්සත් ජනපද රාජ්‍ය ලේකම්වරයා දැන් දැන් කරන ප්‍රකාශ ද මෙම තර්ජනයන්ට ඇතුලත්ය. පසුගිය මාසයේදී ඔහු ප්‍රකාශ කලේ "ඉරානය පරමානු අවි දරා සිටීමේ අදහස පිලිගැනීමට" එක්සත් ජනපදයට නොහැකි බවය. "සම්බාධක සඳහා තවමත් ඉඩ තිබෙන නමුත් එක්තරා අවස්ථාවක දී සම්බාධකවලින් ප්‍රයෝජනයක් නොවන බව අප තේරුම් ගත යුතු" බව ඊස්රායල ආරක්ෂක ලේකම් ඒහුඩ් බරාක් ප්‍රකාශ කලේය.

ධවල මන්දිරය ඉරානය පිලිබඳ පුවත්පත් සාකච්ඡාවක් සඳහා ඇහිඳ ගනු ලැබූ මාධ්‍යවේදීන්ට ආරාධනා කලේ මෙම වාතාවරනය තුලය. වාර්තා වෙන අන්දමට මෙම සාමාන්‍ය සිද්ධියේ "මැදිහත්කරු" අන් කවරෙකුවත් නොව ජනාධිපති ඔබාමා බව ඔවුන් දැන ගත්තේ ඔහු එතැනට පැමිනීමෙන් අනතුරුව පමනි.

ඔබාමාගේ අරමුන වූයේ ඉරාන ආන්ඩුවට දැඩි අනතුරු ඇඟවීමක් කිරීමය: ඉරාන ආන්ඩුව එක්කෝ එහි පරමානු වැඩ පිලිවෙල අතහැර දමන්නැයි අනවන එක්සත් ජනපද ඉල්ලීම්වලට යටත් විය යුතුය, නැතිනම් එක්සත් ජනපද ප්‍රහාරයකට මුහුන දිය යුතුය.

ඉරාන නිලධාරීන් "තමන්ට 'ඔව්' යැයි කිවහැකි දේ කුමක්දැයි දැනගෙන සිටිය යුතු" ය. "ජාතික අභිමානය" පරමානු අවි සංවර්ධනය කිරීමට ඉරානය පොලඹවන්නේ නම්, "එහි වන්දිය ඔවුන් ගෙවනු ඇත"යි හෙතෙම තවදුරටත් සඳහන් කලේය. "කලාපයේ පරමානු අවි තරගයක් වැලක්වීමට හා පරමානු අවි වලින් සන්නද්ධ ඉරානයකට ඉඩ නොදීම" පිනිස "සියලු ක්‍රියාමාර්ගයන්" විවෘතව පවතී යයි ඔහු ප්‍රකාශ කලේය.

ඉරානය සමඟ නව සාකච්ඡාවන් සඳහා සැලසුම් පිලිබඳ ඇඟවුම් ඉස්මතු වෙමින් තිබියදී රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිලිබඳව කෙරුනු ඔබාමාගේ හිස් ප්‍රකාශ කිසියම් මාධ්‍යවේදියෙකු වරදවා වටහා ගනු ඇතැයි යන බියෙන් ජ්‍යෙෂ්ඨ ධවල මන්දිර නිලධාරීන් එහි සිටි මාධ්‍යවේදීන් අතර යුදකාමී වාර්තාකරුවෙක් වන රොබට් කගාන් කැඳවා කෙලින්ම කාරනය ගැන කථාකරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියේ ය.

ඉරානය සමග පවත්වන රාජ්‍යතාන්ත්‍රික කටයුතු පිලිබඳව එක්සත් ජනපද නිලධාරීන්ගෙන් විමසූ මාධ්‍යවේදීන්ට වොෂිංටන් පෝස්ට් පුවත් පතේ තීරුවක් තුල කගාන් චෝදනා එල්ල කලේය: "මෙය නිලධාරීන් අසීරු තත්වයකට ඇද දැමීය: පාලන තන්ත්‍රය නව රාජ්‍යතාන්ත්‍රික ආරම්භකත්වයන්ට මුලපුරමින් නොසිටීයැයි එක එල්ලේ කීමට ඔවුන්ට අවශ්‍ය නොවීය. මන් ද යත් පාලනාධිකාරිය රාජ්‍යතාන්ත්‍රික කටයුතු ගැන යන්තමින් හෝ උනන්දුවක් නොදක්වන බවට මෙයින් වැරදි වැටහීමක් ඇති කල හැකිව තිබූ නිසාවෙනි."

"වික්ෂිප්තභාවයට පත් එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පසුව මට සඳහන් කල පරිදි, මෙම පුවත්පත් සාකච්ඡාවේ ප්‍රස්තුත අරමුන රාජ්‍යතාන්ත්‍රික එකක් නම්, පාලන තන්ත්‍රය ඉරානයට බලපෑම් කිරීමෙහි ලා පෙරමුනේ සිටින සියලුම පුද්ගලයින් වෙනුවට එහි ඉහලම සාකච්ඡාකරුවන් සාකච්ඡාවට ගෙන ආ හැකිව තිබුනි"යැයි ඔහු කරුනු දැක්වීය.

ඇත්ත කාරනය නම්, ඔබාමා පාලනාධිකාරියේ පිලිවෙත, සාකච්ඡාවට බඳුන් කල නොහැකි, සමච්චල්කාරී ලැයිස්තුවක් ටෙහෙරානයට බලාත්කාරයෙන් පැටවීම මිස කිසිසේත්ම ඉරානය

සමඟ සාකච්ඡා කිරීමේ අරමුනින් යුත් එකක් නොවේ. මේවා ඉදිරිපත් කලේ, සම්බාධක සහ යුද තර්ජන මෙහෙයුමක් එක්කෝ ටෙහෙරානය යටත් වීමකට මෙහෙය වනු ඇත, නැතිනම් එක්සත් ජනපද මිලිටරි මෙහෙයුමක් සඳහා පදනම දමනු ඇත යන ද්විත්ව අරමුනු සහිත පිලිවෙතක සන්දර්භයක් තුලය.

පසුගිය වසරේ ජූනි මාසයේදී, අහමඩිනෙජාඩ් ජනාධිපති ලෙස තේරීපත් වීම ආපසු හරවමින් ටෙහෙරානයේ එක්සත් ජනපද-ගැති තන්ත්‍රයක් අටවා ගැනීමට ඔබාමා පාලනාධිකාරිය අසාර්ථක තැතක් දැරීය. එක්සත් ජනපදය ඉරානයේ මධ්‍යම පන්තික කොටස්වල සහාය ලත් පරාජිත ජනාධිපති අපේක්ෂක මීර් හුසේන් මවුසාවි හා බිලියනපති ධන කුවේරයෙකු වන අක්බාර් හස්හේමි රෆ්සන්ජානි විසින් මෙහෙයවූ ඊනියා "හරිත විප්ලවයට" උපායාත්මකව සහාය පල කලේය. කෙසේවෙතත්, ඉරාන සමාජයේ ධනවත් ස්ථරවලින් සැදුම්ලත් මෙම බලවේග පලල් සහායක් ගොනුකර ගැනීමට අසමත් වීමේ කාරනය මත පසුබෑමට ලක්වූ කල වොෂිංටනය පස්සට පියවරක් තැබීය.

යම් ආකාරයක අභ්‍යන්තර "පාලනතන්ත්‍ර වෙනසක්" සඳහා තවමත් ඉඩකඩ පැවතිය හැකියයි එක්සත් ජනපද පාලානාධිකාරිය විශ්වාස කරති. මෑතකදී කඩවීදිවල පැවති වෙලන්ඳන්ගේ වර්ජනය සමඟ හරිත විප්ලවය පිටුපස සිටි දේශපාලන බලවේග පෙල ගැස්විය හැකි බවත් මෙම බද්ධ කිරීම මගින් "පාලන තන්ත්‍රයට සැබෑ තර්ජනයක් එල්ල කල හැකි වෙතැයි" ධවල මන්දිරයේ නිලධාරීන් ගනන් බැලූ බව කගාන් සටහන් කලේය.

කෙසේවෙතත් දැන් දැන් පෙනී යන්නේ කලාපයේ තම අවශ්‍යතාවන් සුරක්ෂිත කරගැනීමේ එකම මාවත ලෙස ඔබාමා පාලානාධිකාරිය වඩ වඩාත් යුද්ධය මත පිහිටා සිටින බවකි. ඉරානය සමඟ පවත්නා ඝට්ටනයෙන් එක්සත් ජනපදය ලබන ජයක් වොෂිංටනයේ කීර්තිය හා ලෝක සබඳතාවල අධිකාරිය පවත්වා ගැනීමෙහි ලා මේ මොහොතේ තීරනාත්මක කරුනක් වන බව එය සලකයි.

ද්වී පාර්ශවීය ප්‍රතිපත්ති මධ්‍යස්ථානයේ (බීපීසී) උපදේශක මන්ඩලයක් විසින් ඔබාමා පාලන තන්ත්‍රයට නිකුත් කල වාර්තාවකින් සටහන් කලේ, "විරුද්ධත්වය පල කරන අනතුරු ඇඟවීම් පුන පුනා නිකුත් කිරීමෙන් පසුවත් ටෙහෙරානයට පරමානු අවි එලිපත්ත පැනීමට" හෙවත් පරමානු අවි දැරීමට ඉඩ දෙන්නේ නම්, "ඇමරිකාවේ අධිකාරිය. . . .බරපතල අයුරින් වියැකී යනු ඇත" යන්නයි. ලෝකයේ සුපිරි මිලිටරි බලවතා වසයෙන් එහි අධිකාරය රැක ගැනීමට "සුවිශේෂී වැඩසටහනක්" සඳහා එක්සත් ජනපදය සූදානම් විය යුතු බවට එය නිශ්චය කල අතර, "මිලිටරි විසඳුමක් වෙනුවෙන් පැහැදිලි, විස්වාසනීය සූදානමක්" සඳහා කැඳවුම් කලේය.

ඉරානයේ පරමානු අවි වැඩසටහනට එරෙහි එක්සත් ජනපද මෙහෙයුම දේශපාලන වංචාවකි. පරමානු අවිවලින් සන්නද්ධ ඉන්දියාවට එරෙහිව වොෂිංටනය එවැනි මෙහෙයුමක් දියත්කොට නැත. මන්දයත් ඉන්දියන් හමුදාව, කලාපයේ එක්සත් ජනපද මූලෝපායික වත්කමක් ලෙස ඔවුන් සලකන බැවිනි. වොෂිංටනය විසින් මූලෝපායාත්මක ප්‍රතිමල්ලවයෙක් ලෙස සලකන ඉරානය සම්බන්ධයෙන් ගත් කල්හි, ඉරානය තමන්ගේ බලශක්තිය සඳහා පමනක් යොදා ගන්නේයැයි කියන රටේ පරමානු කර්මාන්තය, එරට හුදකලා කර යටත් කරගැනීම සඳහා වන එක්සත් ජනපද මෙහෙයුම සඳහා නිමිත්තක් කරගෙන තිබේ.

මුලුමනින්ම ස්වයං දේශපාලන සෝදාපාලුවකින් තොරව ඉරාන පාලන තන්ත්‍රයට, එක්සත් ජනපදය තමන්ට තර්ජනයක් වසයෙන් නොසැලකිය යුතුයැයි ප්‍රදර්ශනය කිරීමට කිසිසේත්ම පුලුවන් කමක් නැත. එක්සත් ජනපදය වාඩිලාගෙන සිටින ඉරාකය හා ඇෆ්ගනිස්ථානය මෙන්ම ලෙබනනය හා ගාසා තීරයේ දේශපාලන සහ මිලිටරි සංස්ථාපිතයන් සමඟ ඉරානයට සබඳතා පවතී; එය චීනය වැනි එක්සත් ජනපදයේ ප්‍රමුඛ තරගකරුවන්ගේ මෙන්ම ලෝක වෙලඳපොලේ ද ප්‍රධාන තෙල් හා ගෑස් සැපයුම්කරුවෙකි; තවද එය සැලකිය යුතු පරමානු වැඩපිලිවෙලක් සංවර්ධනය කර තිබේ.

වොෂිංටනය සමග දිගු කල් පවත්නා සම්මුතියකට පිවිසීමට නම් ඉරානයට, එක්සත් ජනපදය හා ඊස්රායලය විසින් මිරිකාගෙන සිටින ප්‍රදේශවල පක්ෂවලට හා විරෝධතා ව්‍යාපාරවලට සහයෝගය දීම ප්‍රසිද්ධියේම ප්‍රතික්ෂේප කිරීමට සිදු වනු ඇත, එක්සත් ජනපද සමාගම්වලට ඉරානයේ තෙල් බිම්වලට ප්‍රවේශ වීමට හෝ ඒවා පාලනය කිරීමටත් එහි පරමානු වැඩපිලිවෙල සතුරු ඇඟිලිගැසීම්වලට නිරාවරනය කිරීමටත් සිදුවනු ඇත. මෙසේ කිරීම ඉරාන ආන්ඩුව

ඇමරිකානු අධිරාජ්‍යවාදයේ හෙංචයියෙක් බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමක් ලෙස සැලකෙනු ඇත.

ටෙහෙරානය එවැන්නකට ඉදිරිපත් නොවනු ඇති බවට වන සැකය වැඩෙත්ම යුද්ධයක් කෙරෙහි පක්ෂපාතී වොෂිංටනයේ උත්සුකතා දැඩි වෙමින් තිබේ. යුද්ධයට විරුද්ධ මහජන මතය මෘදු කිරීමේ පුවත්පත් මෙහෙයුමකට පවා ඉල්ලුම් කරනු ලැබේ. ප්‍රන්ස පුවත්පතක් වන *ලා මොන්ඩෙ* "ඉරානය සමඟ කෙරෙන යුද්ධයක දර්ශන පථයට මහජනයා මානසිකව සූදානම්" වනු ඇත් ද නැත්ද යන්න මැතකදී විමසා බැලූ අතර ද්වි පාර්ශවීය ප්‍රතිපත්ති මධ්‍යස්ථානයේ (බීපීසී) වාර්තාවක්, "මිලිටරි විසඳුම් පිලිබඳ මහජන සාකච්ඡාවක්" වෙනුවෙන් කැඳවුම් කර සිටියේය.

මාධ්‍යකරුවන් අතලොස්සක් දෙනා විසින් ආවරනය කල අප්‍රසිද්ධ සාකච්ඡාවක දී නිකුත් කල එක්සත් ජනපදයේ තර්ජන, මහජන මතය සඳහා ඔබාමා පාලන තන්ත්‍රයේ පිලිකුල විදහා දක්වයි. බුෂ් පාලනාධිකාරියේ ආක්‍රමනකාරී යුද පිලිවෙතට විරුද්ධ මහජන විරෝධය ගසාකමින් බලයට පත් වූ ඔබාමා දැන් ඉරාකයේ සහ ඇෆ්ගනිස්ථානයේ ගැටුම් ඉක්මවා යනු ඇති සහ සමස්ත කලාපයම ගිල ගැනීමේ තර්ජනය ගැබ්කරගත් යුද්ධයක් ආරම්භ කිරීමට ගර්ජනය කරයි.

ඇලෙක්ස් ලැන්ටියර්

© www.wsws.org